






- **පහත රූප අතරින් එකිනෙකට නොගැළපෙන රූප යුගලය වන්නේ,**

1.

(1)

(2)

(3)

2.

(1)

(2)

(3)

- **පහත දී ඇති රූප සටහන සලකා 3 හා 4 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




3. මෙම රූපයේ සිටින සතුන් වර්ග කිරීමට යොදාගෙන තිබෙන්නේ,
   (1) ආහාර (2) පාද (3) ශරීර ප්‍රමාණය

4. ගවයා සහ හාවා යන සතුන්ගෙන් අදහස් වන්නේ,
   (1) මාංශ භක්ෂක (2) ශාක භක්ෂක (3) සර්ව භක්ෂක

- **5 සහ 6 ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන වචනය දී ඇති පිළිතුරු අතරින් තෝරා හිස්තැන මත ලියන්න.**

5. කුසගින්නට : ආහාර නම්, පිපාසයට : ..........................................
   (1) වතුර (2) බීම (3) කෑම

6. මිනිත්තු : කාලය නම් ලීටර : ..........................................
   (1) බර (2) ද්‍රව (3) උස




- **නිවැරදි පිළිතුර තෝරන්න.**

7. 99 සිට 115 තෙක් සංඛ්‍යා ලිවීමේදී 0 ලියවෙන වාර ගණන කීයද?
   (1) 12 යි. (2) 24 යි. (3) 32 යි.

8. සවස් කාලයේදී දකුණු සහ සබරගමුව පළාත්වල හදිසි සුළං තත්ත්වයක් ඇති වන බව නිවේදනය කරන ලදී. එයට අදාළ නගර දෙක දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) මොණරාගල , පුත්තලම (2) පොළොන්නරුව , නුවර
   (3) ගාල්ල , රත්නපුර

9. පහත දී ඇති වාක්‍ය අතුරින් නිවැරදිව ලියා ඇති වාක්‍යය තෝරන්න.
   (1) කන්ද උඩින් ඉර පායයි. (2) කනද උඩින් ඉර පායයි.
   (3) කන්ද උඩින ඉර පායයි.

10. සමමිතික රේඛා තුනක් පමණක් ඇඳිය හැකි රූපය තෝරන්න.

(1)

(2)

(3)


11. මුහුණ බලන කන්නාඩියකින් බැලූ විට වෙනස් නොවී පෙනෙන අකුර තෝරන්න.

(1) **M** (2) **K** (3) **G**





- **මුලින් දී ඇති රූපයට සමාන රූපය තෝරන්න.**

12.


(1)

(2)


(3)

13.


(1)

(2)

(3)

14. නිවැරදි අර්ථයක් දෙන වැකියට හිමි අංකය රවුම් කරන්න.
    (1) දූ දරුවන්ගේ අභිමාන දෙමව්පියන්ට ජයග්‍රහණයකි.
    (2) දූ දරුවන්ගේ ජයග්‍රහණ දෙමව්පියන්ට අභිමානයකි.
    (3) දෙමව්පියන්ගේ දූ දරුවන් ජයග්‍රහණයට අභිමානයකි.

15. (1) ඩෙංගු උවදුර මර්දනය කිරීමට වඩා තුරන් කිරීම යහපත් ය.
    (2) ඩෙංගු උවදුර තුරන් කිරීමට වඩා මර්දනය කිරීම යහපත් ය.
    (3) ඩෙංගු උවදුර මර්දනය කිරීමට වඩා වර්ධනය කිරීම යහපත් ය.


- **පහත රූපය ඇසුරින් පිළිතුරු සපයන්න.**




16. A ට පමණක් අයිති අංක වන්නේ,
    (1) 5 (2) 1 (3) 3

17. B ට හා C ට දෙකට පමණක් අයිති අංක වන්නේ,
    (1) 5 (2) 3 (3) 2

- **කොඩි වැලක රතු, කහ , සුදු, නිල් ලෙස පිළිවෙළින් කොඩි අමුණා ඇත. ඒ ඇසුරෙන් පිළිතුරු තෝරන්න.**



18. මෙහි 40 වන කොඩිය විය හැක්කේ,
    (1) නිල් (2) රතු (3) කහ


19. මෙහි කහ පාට කොඩියක් විය හැක්කේ,
    (1) 7 වන කොඩිය (2) 6 වන කොඩිය (3) 8 වන කොඩිය


20.


| | | |
|---|---|---|
| 2 | 4 | 6 |
| 4 | B | 8 |
| A | 8 | 10 |

A හා B සඳහා සුදුසු අගයයන් පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.
(1) 6, 4 (2) 6 , 6 (3) 6 , 10

**රූප සැදෙන ආකාරය අනුව හිස්තැනට ගැළපෙන රූපය තෝරන්න.**







22. 

මෙහි සිටින සමන්ට නිවසට යාමේදී වාර කීයක් වමට හැරී යා යුතු ද?

(1) 5 (2) 6 (3) 7

23. රට, පළාත, දිස්ත්‍රික්කය, ගම යන ඒවා අතර සම්බන්ධය දැක්වීමට මෙම රූපය ඇඳ තිබේ.





මෙහි A මගින් දක්වා ඇත්තේ කුමක් ද?

(1) පළාත

(2) දිස්ත්‍රික්කය

(3) ගම


24. පහත කඩදාසිය ඊතලය ඇති දෙසට නවා දෙවන රූපයේ ඇති තිත් ඉරි දිගේ කපා වෙන් කරන ලදී.




දැන් වෙන් වී යන ත්‍රිකෝණ ගණන වන්නේ,

(1) 2 (2) 4 (3) 3

- **රටාව අනුව අංක 25 සහ 26 ප්‍රශ්නවල හිස්තැනට තිබිය යුතු රූපය තෝරන්න.**

25. 




(1) (2) (3)

26. 



(1) (2) (3)

27. පහත රූප කොටස් එකතු කර සෑදිය හැකි ඝන වස්තුව වන්නේ,



(1) සිලින්ඩරය

(2) ඝනකය


(3) ඝනකාභය

- **පහත වචනවලින් නොගැළපෙන වචනය වන්නේ,**

28. (1) යනවා (2) එනවා (3) පිපෙනවා

29. (1) ලොකු (2) රස (3) සුවඳ


- **රූපයට ඉතා සමීප සම්බන්ධයක් දක්වන වචන අඩංගු පිළිතුර තෝරා එයට යටින් ඉරක් අඳින්න.**

30. 

(1) අව්ව - වැස්ස - ආරක්ෂාව

(2) රස්නය - වැස්ස - ආහාර

(3) අව්ව - සල්ලි - ආරක්ෂාව

31. 

(1) ආලෝකය - ඉන්ධන - සුන්දර

(2) ඉන්ධන - ආලෝකය - ගින්දර

(3) ඉන්ධන - තිරය - ආරක්ෂාව

- **පහත දක්වා ඇති සංවාදය කියවන්න.**

*ආ...කොහෙද දෙන්නා යන්නේ?*

*අපි යනවා සිහෙලිගෙ ගෙදර. ඔයා මොකද කරන්නේ ?*

*මම චොනිල්කා එනකම් පාසල් යන්න ඉන්නවා*

32. මෙහි කී දෙනෙකු ගැන කියවේ ද?

(1) හතරයි. (2) පහයි. (3) හයයි.

33. මේ දවසේ කුමන වේලාවක් ද?

(1) උදේ (2) දවල් (3) සවස

- **අංක 34 සහ 35 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටස මුල් සිදුවීමට හේතුවක් වේ නම් වරහන තුළ (✓) ලකුණ ද, හේතුවක් නොවේ නම් (×) ලකුණ ද යොදන්න.**

34. මදුරුවන් බෝවීම බහුල වූයේ <u>තැන තැන වතුර රැඳුණු නිසා ය.</u> (........)

35. දෙව්මිණ විභාගය සමත් වූයේ <u>හොඳින් පාඩම් නොකළ නිසා ය.</u> (........)

36. වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $6 \times 3 - 6 = 12$ (2) $4 \times 2 \times 10 = 80$ (3) $6 \times 5 - 7 = 12$

37. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) $25 + 35 + 15 = 75$ (2) $15 + 25 + 45 = 65$ (3) $15 + 25 + 55 = 85$

- **ප්‍රශ්න අංක 38 සිට 40 තෙක් ප්‍රශ්නවල හිස්තැනට ගැළපෙන ආඛ්‍යාත පදය වරහනින් තෝරා ලියන්න.**

38. ගංගා ගලා ............................................. (බසියි / බසිති )

39. අක්කා ද මම ද පාසල් ................................ (යන්නෙමි / යන්නෙමු)

40. ඇ ලස්සනට ............................................. (නැටුවා ය. / නැටුවේ ය)

ඇඹිලිපිටිය රාජකීය විද්‍යාලයේ ආචාර්ය
රුවන් ප්‍රසන්න සෙනරත්
(ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා,
විද්‍යාපීඨ ප්‍රාථමික පුහුණු බී. ඒ.)

